කොළඹදී පවත්වනු ලබන (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන)

බස්නාහිර පළාත්බද මහාධිකරණයේදීය.

මහාධිකරණ විනිසුරු රත්නප්‍රිය ගුරුසිංහ මැතිතුමා ඉදිරිපිටදී ය.

වාර්තා කරන්නේ:- ල/ලේ. ආශා සම්මානී විසිනි.

නඩු අංකය:-29/2018/IP

දිනය:- 2019.02.15

අතුරු ඉන්ජන්ෂන් ඉල්ලීම සම්බන්ධ නියෝගය.

පැමිණිලිකාර සමාගම විත්තිකාර සමාගමට එරෙහිව මෙම නඩුව පවරා ඉල්ලා ඇති සහන අතර පැමිණිල්ලේ ආයාචනයේ "ඊ" ඡේදයේ ඉල්ලා ඇති පරිදි අතුරු ඉන්ජන්ෂන් තහනමක්ද "උ" ඡේදයේ ඉල්ලා ඇති පරිදි වරණ නියෝගයක්ද ඉල්ලා ඇත. දැනට වාරණ නියෝගය නිකුත් කර ඇත.

පැමිණිල්ලේ ආයාචනයේ "ඊ" ඡේදයේ මෙසේය. මේ නඩුව අසා තීරණය කරනතුරු P25(a), P25(b) සහ P25(c) හෝ P28(a) සහ P28(b) යනුවෙන් ලකුණු කරනලද ලේඛන වල සඳහන් පරිදි විත්තිකරු විසින් "චන්ඩි පැන්ඩා" වෙළඳ ප්‍රචාරක දැන්වීම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් සහ/ හෝ වෙනත් සාරානුකූලව සමාන වෙළඳ ප්‍රචාරක දැන්වීම් පල කිරීමෙන් විකාශන කිරීමෙන් සහ/ හෝ පල කිරීමට/ විකාශනය කිරීමට සැලැස්වීමෙන් සහ/ හෝ වැරදි සහගත ලෙස නීතිවිරෝධි ලෙස අයුතු සහගත ලෙස ආචාර්ය ධර්ම වලට පටහැනි ලෙස පැමිණිලිකරු සහ/ හෝ ඉහත කී ලයිෆ් බෝයි සහ/ හෝ ලක්ස් සහ/ හෝ ලයිෆ් බෝයි සහ ලක්ස් යන බෙදීන් බාර් අපකීර්තියට පත්වන ආකාරයට විත්තිකරුගේ වෙළඳ ප්‍රචාරක දැන්වීම්/ පළකිරීම්/ ප්‍රවර්ධන ලිපි ද්‍රව්‍ය භාවිත

21 FEB 2019
කොළඹ 12.

කරමින් විත්තිකරු සහ විත්තිකරුගේ යම් සේවකයෙකු නියෝජිතයෙකු කොන්ත්‍රාත්කරුවෙකු පැවරුම්ලාභියෙකු සහ නාමිකයෙකු වළක්වාලන අතුරු ඉන්ජන්ෂන් තහනමක් ලබාදෙන ලෙසත් යනුවෙන්ය.

මෙම අතුරු තහනම මඟින් නතර කිරීමට බලාපොරොත්තු වන දැන්වීම් වල කිසිවක පැමිණිලිකරුගේ නමක් හෝ පැමිණිලිකාර ආයතනයේ නිශ්පාදනය කරන නිශ්පාදනයක නමක් හෝ නැත. එසේම එවැනි නිශ්පාදනයක් එම දැන්වීම්වල පෙන්වා සිටින්නේද නැත. පැමිණිලිකාර සමාගම ප්‍රධාන වශයෙන්ම මෙම දැන්වීම් වලට විරුද්ධ වී ඇත්තේ මෙම දැන්වීම් වල සඳහන් කරන "බෙදින් බාර් වලට සබන් කියන්න බැහැ" සබන් වල SLS ප්‍රමිතිය අනුව සබන් වල TFM අගය 76% ට වැඩි වෙන්න ඕනේ. බෙදින් බාර් වල අගය ඊට ගොඩක් අඩුයි යන අදහසටත් 2 වන වෙළඳ දැන්වීමේ සිසුවෙකු "ටිචර් කියපු විදියට සබන් වෙන්න නම් TFM අගය 76% වඩා වැඩි වෙන්න ඕනේ. මේක බෙදීන් බාර් අම්මා රැවටිලා" යනුවෙන් සඳහන් කරන කොටස සම්බන්ධයෙන් විරෝධතාවය ඇත. මෙහිදී විශේෂයෙන්ම රැවටිලා යන වචනය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ල කියා සිටින්නේ ඒ තුළින් තමන්ගේ නිශ්පාදනයන්ට හානියක් සිදුවන බවය. තවත් දැන්වීමක TFM අගය අඩු බෙදින් බාර් වල පෙන වැඩි කිරීම සඳහා ඇතැම් විට රෙදි සෝදන කුඩු සඳහා භාවිතා කරන මිල අඩු ඇල්කයිල් සල්ෆේට් හෝ සෝඩියම් ඩොඩේසයිල් බෙන්සිල් සල්ෆොමේට් යන ද්‍රව්‍ය එකතු කරන බව දක්වා ඇත. ඉදිරිපත් කල කරුණු සලකා මුල් අවස්ථාවේ වාරණ නියෝගයක් නිකුත් කර ඇත.

විත්තිකාර සමාගම විරෝධතා ගොනු කර ඔවුන්ට එරෙහිව නිකුත් කර ඇති වාරණ නියෝගය විසුරුවා හරින ලෙසත් අතුරු ඉන්ජන්ෂන් තහනම ඉවත් කරන ලෙසත් ඉල්ලා ඇත. ඔවුන් ප්‍රධාන වශයෙන්ම කියා සිටින්නේ ඔවුන්ගේ වෙළඳ දැන්වීම් වල

21 FEB 2019
කොළඹ 12.

පැමිණිලිකාර ආයතනයේ නිශ්පාදන පිළිබඳව කිසිදු සඳහනක් නැති බවය. එසේම පැමිණිලිකාර සමාගමට අතුරු ඉන්ජන්ෂන් තහනමක් ලබාගැනීමට අවශ්‍ය කරන බැලූ බැල්මට සනාථ වන නඩුවක් නැති බවත් මෙම දැන්වීම් දැනට මාස ගණනාවක සිට තිබෙන බැවින් ප්‍රමාද වී කරන ඉල්ලීමක් බවත් විශේෂයෙන්ම පැමිණිලිකාර සමාගම බේදින් බාර් නැමති නිශ්පාදනය සබන් ලෙස හඳුන්වමින් විකුණන බවත් එය බුද්ධිමය දේපල පනතේ විධිවිධාන පරිදි අවංක පරිචයක් වශයෙන් හැඳින්වීමට නොහැකි බවත්ය. SLS ප්‍රමිතිය අනුව රෙදි සෝදන සබන් බේදින් බාර් , ටොයිලට් සෝප් සහ බේබි සෝප් යනුවෙන් වර්ග 04 ක් තිබෙන බව පෙන්වා දී ඇත. ඒවායින් ලොන්ඩ්‍රි සෝප් නැතහොත් රෙදි සෝදන සබන් සඳහා තවත් උපවර්ග වලට බෙදා ඇත. බේබි සෝප් නැතහොත් ළඳරු සබන් සඳහා TFM ප්‍රතිශතය 78% ක් ද ටොයිල් සෝප් 78% ට ඉහළ වීමටද ටොයිලට් සෝප් සඳහා 76.5% කට වඩා ඉහළ වීමටද ලොන්ඩ්‍රි සෝප් 1 සහ 2 සඳහා 59% ක් හෝ ඊට වැඩි වීමටද 3 වෙනි ලොන්ඩ්‍රි සෝප් වර්ගය සඳහා 45% ක් වශයෙන්ද දක්වා ඇත. බේදින් බාර් සඳහා TFM ප්‍රතිශතය අවම 40% ක්ද මතුපිට දමන ද්‍රව්‍යයක් වශයෙන් සලකන Surfactant යන ද්‍රව්‍ය 2% කට ප්‍රමාණයකටද එකතු කරන බව දන්වා ඇත.

ඊට අමතරව පැමිණිලිකාර සමාගම නිශ්පාදනය කරන ලක්ස් සහ ලයිෆ් බෝයි යන නිශ්පාදන වල සෝඩියම් ඇල්කයිල් සල්ෆේට් සහ සෝඩියම් ඩොඩෙසයිලි බෙන්සීන් සල්ෆේට් යන රසායන ද්‍රව්‍ය අඩංගු කර ඇති බව පෙන්වා දී ඇත. එසේම එම පැමිණිලිකාර සමාගම ම ලංකාව හැර වෙනත් රට වල නිෂ්පාදනය කරන ලක්ස් හෝ ලයිෆ්බෝයි සබන් සඳහා එම රසායන ද්‍රව්‍ය යොදන්නේ නැති බව ද ලේඛන මඟින් පෙන්වා දී ඇත. පෙර සඳහන් කල රසායන ද්‍රව්‍ය විශේෂයෙන් පාවිච්චි කරන්නේ ඇඟ ගල්වන සබන් සඳහා නොව රෙදි සෝදන සබන්, රෙදි සෝදන ඩිටර්ජන් වර්ග, භාජන සේදීමට ගන්නා ඩිටර්ජන් වර්ග හෝ වාහන සේදීමට, කාපට් සේදීමට ආදියට භාවිතා කරන වර්ග බවය. එසේම ලංකාවේ බේදින් බාර් නිෂ්පාදනය කරන එකම සමාගම

21 FEB 2019
කොළඹ 12.

පැමිණිලිකාර සමාගම නොවන බවත්, අනිකුත් සමාගම් ද බෙදින් බාර් නිෂ්පාදනය කරන බවත්, එම සමාගම් පැමිණිලිකාර සමාගම භාවිතා කරන ඉහත සඳහන් කල රසායන ද්‍රව්‍යයන් පාවිච්චි කරන්නේ නැති බවත් පෙන්වා දී ඇත. ඔවුන් ඊට උදාහරණ වශයෙන් හේමාස් සමාගම නිෂ්පාදනය කරන වෙල්වට් සබන්, රෙකිට් සමාගම නිෂ්පාදනය කරන ඩෙටෝල් බෙදින් බාර්, ස්වදේශීය සමාගම නිෂ්පාදනය කරන රාණි බෙදින් බාර්, ස්වදේශීය සමාගම නිෂ්පාදනය කරන කොහොඹ බෙදින් බාර්, උපාලි සමාගම නිෂ්පාදනය කරන සැන්ටූර් බෙදින් බාර් යනාදිය පෙන්වා දී ඇත.

අතුරු ඉංජන්ෂන් තහනමක් නිකුත් කිරීමේදී ශ්‍රී ලංකාවේ සලකා බලනු ලබන ප්‍රධාන කාරණා 3 ක් ඇත. මේ සම්බන්ධයෙන් ඉතා ප්‍රසිද්ධ නඩු තීන්දුවක් වන 1981 (2) ශ්‍රී ලංකා නීති වාර්තා 287 පිටුවේ සඳහන් "ෆිලික්ස් ඩයස් බණ්ඩාරනායක එරෙහිව රාජ්‍ය චිත්‍රපට සංස්ථාව" නඩුවේදී දීර්ඝ වශයෙන් සලකා බලා ඇත. එහි ඒ දක්වා තිබූ අතුරු ඉන්ජන්ෂන් නීතියට සම්බන්ධ ප්‍රධාන නඩු තීන්දු සියල්ලම පාහේ සලකා බලා ඇත.

ඒ අනුව අතුරු ඉන්ජන්ෂන් තහනමක් නිකුත් කිරීමට නම් පැමිණිල්ල විසින් සමත් විය යුතු ප්‍රධාන කාරණා 3 ක් පිළිවෙලින් ඇත. ඉන් එක කාරණාවක් හෝ පැමිණිල්ල සමත් වන්නේ නැති නම් අතුරු ඉන්ජන්ෂන් තහනමක් නිකුත් කරන්නේ නැත. ඉන් පළමුවැන්න නම් පැමිණිලිකරු ප්‍රබල බැලූ බැල්මට සනාථ කළ හැකි නඩුවක් ඉදිරිපත් කර තිබෙන්නේද නැතහොත් ඔහුගේ නෛතික අයිතිවාසිකම් වලට බැලූ බැල්මට හානියක් සිදු වීමේ අවධානම බරපතල ලෙස තිබෙන්නේද, නඩු විභාගයේදී සලකා බැලිය යුතු බරපතල ප්‍රශ්න තිබෙන්නේද, පැමිණිලිකරු ජයග්‍රහණය කිරීමට ඇති හැකියාව වැඩිද යන කාරණයයි.

21 FEB 2019
කොළඹ 12.

දෙවන කාරණය වන්නේ, අතුරු ඉන්ජන්ෂන් තහනමක් නිකුත් කිරීම හෝ නිකුත් නොකිරීම තුලින් වඩාත් අපහසුවට ලක් වන්නේ කවුරුන්ද යන කාරණයයි. එසේම අලාභ අය කර ගැනීමෙන් සෑහීමට පත් විය හැකි කාරණා සම්බන්ධයෙන් අතුරු ඉන්ජන් තහනම් නිකුත් කරන්නේද නැත.

තුන්වන කාරණය වන්නේ සාධාරණත්වයේ මූලධර්මයි. මෙහිදී පැමිණිලිකරු කොතෙක් දුරට සාධාරණව කටයුතු කර තිබෙන්නේද , අප්‍රමාදීව පැමිණ තිබෙන්නේද, පැමිණිලිකරු පිරිසිදු දැතින් අධිකරණය වෙත පැමිණ තිබෙන්නේද යන කාරණා සලකා බලනවා ඇත.

මෙම නඩුවේ පැමිණිලිකරු වෙනුවෙන් තර්ක කර තිබෙන්නේ බෙදින්බාර් යන නිෂ්පාදනයට සබන් යනුවෙන් හැදින්වීමට නීතියෙන් කිසිදු බාධාවක් නැති බවය. ඔහු එසේ කියා සිටියත් ඔවුන්ගේ නිෂ්පාදන වල ලක්ස් හෝ ලයිෆ්බෝයි යන නිෂ්පාදන වල කිසිදු තැනක සබන් යන වචනය පාවිච්චි කර නැත. එසේම ඔවුන්ගේ නිෂ්පාදනයෙහි බෙදින්බාර් යන වචනය සඳහන් කර ඇත්තේද කිසිදු පුද්ගලයකුට බැලූ බැල්මට පෙනෙන ආකාරයට නොවේ. ඉතාම කුඩා අකුරින් බෙදින්බාර් යන නම සඳහන් කර ඇත. මේ අනුව බැලූ බැල්මට පැමිණිලිකාර ආයතනයද ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයින් නොමඟ යවන ආකාරයේ ක්‍රියාවක යෙදී සිටින බව පැහැදිලිය. ඒ තත්ත්වය මත ඔවුන් පිරිසිදු දැතින් අධිකරණයට පැමිණියාය යැයි පිළිගත නොහැකිය. ඔවුන් ඔවුන්ගේ නිෂ්පාදනය බෙදින්බාර් යනුවෙන් ප්‍රචාරය කරන්නේ නම් කිසිදු ගැටලුවක් නැත. ඔවුන්ගේ කිසිදු වෙළඳ ප්‍රචාරයක මෙම බෙදින්බාර් යන නමට කිසිදු ප්‍රමුඛතාවයක් දී නැත. එය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සඳහන් කර තිබෙන බැවින් කොහේ හෝ තැනක ඉතා කුඩාවට කිසිවකුටත් අවධානය ලක් නොවන පරිදි සඳහන් කර ඇත.

21 FEB 2019

තවත් කරුණක් වන්නේ පෙර සඳහන් කරන ලද ශරීරය සේදීමට නොව වෙනත් ද්‍රව්‍ය සේදීමට පාවිච්චි කරන රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාවේදී පමණක් පැමිණිලිකාර සමාගම ලක්ස් සහ ලයිෆ්බෝයි යන නිෂ්පාදනයන්ට එකතු කර තිබීමය. ඔවුන් වෙනත් රටවලදී එම ද්‍රව්‍ය භාවිතා කර නැත. ඒ අනුව බැලූ විට පැමිණිලිකාර සමාගම ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයින්ට එක්තරා ආකාරයකට අඩු සැලකිල්ලක් දක්වා ඇත. ඒ අනුව බැලූ විටද පැමිණිලිකාර සමාගමේ ක්‍රියා කලාපය අවංක පරිචයක් වශයෙන් හැඳින්වීමට නොහැකිය. මේ තත්ත්වය සලකා බැලීමට පැමිණිලිකාර සමාගම වෙත බැලූ බැල්මට සනාථ වන නඩුවක් තිබෙන්නේද යන කාරණය සැක සහිතය.

පැමිණිලිකාර සමාගමට බැලූ බැල්මට සනාථ වන නඩුවක් තිබෙන්නේය යන උපකල්පනයෙන් කටයුතු කළත් ඔවුන් විසින් පෙර සඳහන් කළ 2 වන සහ 3 වන කරුණු සමත් විය යුතුය. බැලූ බැල්මටම පෙර සඳහන් කරුණු අනුව පැමිණිලිකාර සමාගමේ ක්‍රියා කලාපයද අවංක පරිචයන් වශයෙන් සැලකිය නොහැකිය. එසේම ඔවුන් පිරිසිදු දැතින් අධිකරණය වෙත පැමිණියේ යැයි සලකා බැලිය නොහැකිය. පැමිණිලිකාර සමාගමද එක්තරා ආකාරයකට ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයින් නොමඟ යවන තත්ත්වයෙන් කටයුතු කර තිබෙන බව පෙනී යයි.

විත්තිකාර සමාගමේ දැන්වීම් වල ඔවුන් TFM ප්‍රතිශතය යම් අගයකට වඩා අඩු වර්ග සබන් යනුවෙන් හැඳින්වීමට නොහැකි බව දක්වා ඇත. මෙම තත්ත්වයද විවාදයට ලක් වන කරුණකි. කෙසේ වුවත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිකුත් කර ඇති ප්‍රමිතීන් අනුව ළඳරු සබන් බෙදින්බාර් හෝ ටොයිලට් සෝප් යන නම් වලින්ම ඔවුන් ඔවුන්ගේ නිෂ්පාදන හඳුන්වන්නේ නම් ගැටලුවක් නැත. මෙසේ බැලූ කල විත්තිකාර පාර්ශවයද කිසියම් හෝ දෝෂයක් තිබෙන බව පෙනී ගියත් ඒ හේතුව මතම පැමිණිල්ල ඉල්ලා ඇති

21 FEB 2019

පරිදි අතුරු ඉන්ජන්ෂන් තහනමක් නිකුත් කළ නොහැකිය. පෙර සඳහන් කළ පරිදි පැමිණිල්ල අතුරු ඉන්ජන්ෂන් ඉල්ලීමට සමත් විය යුතු කඩඉම් 3 ම සමත් වන බවක් පෙනී යන්නේ නැත.

මෙම කරුණු සලකා බලා දැනට නිකුත් කර ඇති වාරණ නියෝගය විසුරුවා හරිමි. අතුරු ඉන්ජන්ෂන් ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

අත්/කලේ

(රත්නප්‍රිය ගුරුසිංහ)

මහාධිකරණ විනිසුරු-කොළඹ

2019.02.15.

ඉහත පිටු අංක 1-7 දක්වා සඳහන් වන්නේ කොළඹ වාණිජ මහාධිකරණයේ අංක 29/2018/IP දරන නඩුවේ 2019.02.15 දින නියෝගයේ සත්‍ය පිටපතක් බැව් මෙයින් සහතික කරමි.

පරීක්ෂා කළේ :-

රිසිට්පත් අංකය :- P/24 336410-2019.02.20

රෙජිස්ට්‍රාර්:-

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්
වාණිජ මහාධිකරණය
කොළඹ 12.

මහාධිකරණය
21 FEB 2019